සියලුම හිමිකම් ඇවිරිණි.
All Rights Reserved



# අධ්‍යයන පොදු සහතික පත්‍ර (උ/පෙළ) විභාගය

**13 ශ්‍රේණිය** | **බෞද්ධ ශිෂ්ටාචාරය** | **පිළිතුරු පත්‍රය**

## I පත්‍රය

| | | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|
| 01. (1) | 02. (2) | 03. (4) | 04. (3) | 05. (5) | 06. (2) | 07. (3) | 08. (4) | 09. (1) | 10. (2) |
| 11. (3) | 12. (4) | 13. (1) | 14. (5) | 15. (2) | 16. (1) | 17. (5) | 18. (4) | 19. (3) | 20. (3) |
| 21. (4) | 22. (3) | 23. (2) | 24. (1) | 25. (5) | 26. (5) | 27. (4) | 28. (4) | 29. (3) | 30. (2) |
| 31. (1) | 32. (5) | 33. (4) | 34. (2) | 35. (3) | 36. (4) | 37. (5) | 38. (4) | 39. (3) | 40. (1) |
| 41. (2) | 42. (3) | 43. (3) | 44. (5) | 45. (4) | 46. (2) | 47. (5) | 48. (3) | 49. (5) | 50. (2) |

(ලකුණු 2x50 = 100)

## II පත්‍රය

(එක් ප්‍රශ්නයකට ලකුණු 20 ක් දෙන්න.)

01. (i) රාජ්‍ය පාලනය, දන්දීම, යාගකිරීම, වේදය ඉගනා ගැනීම, කාමයෙහි නොඇලීම
ප්‍රජානාං රක්‍ෂණාංදාහ මිජ්‍යාධ්‍යයන මේවච
විෂයේෂ්ච ප්‍රශක්තිශ්ච ක්‍ෂත්‍රියස්‍ය සමාසතඃ (මනුස්සාති 189 ශ්ලෝකය)

(ii) බ්‍රාහ්මණ වර්ගයට අයත් ආපද්ධර්ම වනුයේ ක්‍ෂත්‍රිය හා වෛශ්‍ය වර්ණයන්ට අයත් ස්වධර්මයයි. ශුද්‍රයාගේ කටයුතු කිරීමට බ්‍රාහ්මණයාට කෙසේ වත් අවසර නැත.

(iii) ★ ඍග්වේදය. ★ යජුර්වේදය. ★ ස්‍යාවත් වේදය. ★ අථර්වග් වේදය. ★ මනුස්මෘතිය

(iv) මනුස්මෘතියට අනුව කාන්තාව බාලකල පියා යටතේත් යොවුන් වියේදී ස්වාමි පුරුෂයා යටතේත් ස්වාමියා මැරුණු පසු වැඩිමහළු පුතා යටතේත් ජීවත් විය යුතුය.
බාල්‍යෙ පිතුර්වශේ තිෂ්ඨේත් ප්‍රාණිග්‍රාහස්‍ය යෞවනේ
පුත්‍රානාං හර්තරි ප්‍රේතේ නභජේත් ස්ත්‍රී ස්වතන්ත්‍ර නාම්

(v) ★ කාන්තාවට පැවිදි වීමේ අයිතිය හිමිකර දිම. මහාප්‍රජාපතීගෝතමී, ඛේමා, උප්පලවන්නා, පටාචාරා වැනි කාන්තාවන් භික්‍ෂුණී ශාසනයේ පැවිදි වී අග්‍රස්ථානයන්ට පත්වීම.
★ විශාඛා, ඛුජ්ජුත්තරා, නකුලමාතා වැනි කාන්තාවන්ට උපාසිකාවන් ලෙස විශේෂ ආගමික වරප්‍රසාද තනතුරු ලබා දීම.
★ භික්‍ෂු භික්‍ෂුණී උභය පක්ෂයටම සමාන අයිතිවාසිකම් හිමිව තිබීම.
★ පිරිමි පක්‍ෂයට මෙන්ම කාන්තාවන්ට ද සමාන ලෙස ආගමික කටයුතු වල නියැලීමට අවකාශ තිබීම.

02. (i) (1) පූර්ණකස්සප අකිරියවාදී / ශාස්වතවාදී
(2) මක්ඛලිගෝසාල අහේතු අප්‍රත්‍යවාදී / නියතිවාදී / සංසාර ශුද්ධි වාදී
(3) පකුධ කච්චායන සප්තකායවාදී / අකිරියවාදී / භෞතිකවාදී / ආත්මවාදී
(4) අජිත කේශකම්බල අකිරියවාදී / භෞතිකවාදී / උච්ඡේදවාදී / දවස්තුක මිත්‍යා දෘෂ්ටිවාදී / සුඛපරමතාදී
(5) සංජය බෙල්ලට්ඨි පුත්ත සංශයවාදී / අමරාවික්ඛේපවාදී
(6) නිගණ්ඨනාත පුත්ත පරම අවිහිංසාවාදී / කර්මවාදී / චාතුයාම සංවරවාදී / පුබ්බේකත හේතුවාදී / කිරියවාදී ස්‍යාද්වාදී / ආත්මවාදී.

(ii) (1) පඨවි (2) ආපෝ (3) තේජෝ (4) වායෝ (5) සුඛ (6) දුක්ඛ (7) ජීව

(iii) (1) නත්ථි දින්නං දුන්දෙයෙහි විපාක නැත. (2) නත්ථි සිට්ඨං යාගයෙහි විපාක නැත.
(3) නත්ථි හුතං හෝම යාගයෙහි විපාක නැත. (4) නත්ථි සුඛං දුක්ඛමානං කම්මානං ඵලංවිපාකෝ කුසල අකුසල කර්මයන්ට ඵලවිපාක නැත. (5) නත්ථි අයං ලෝකෝ මෙලොවක් නැත.

(6) නත්ථි පරෝ ලෝකෝ පරලොවක් නැත. (7) නත්ථි මාතා මවක් නැත. (8) නත්ථි පිතා පියෙක් නැත. (9) නත්ථි ලෝකේ සමනා බ්‍රාහ්මණෝ ලෝකයෙහි සමනාබ්‍රාහ්මණයන් නැත.

(iv)
- ඤාණාවර්ණීය කම් නුවණ මුලාකරණ කම්
- දර්ශනාවරණීය කම් ආත්මය පිරිසිදු කරන කම්
- වේදනීය කම් වේදනා ලබාදෙන කම්
- මෝහනීය කම් දියුණුව පරිහානිය කම්ය.
- ආයු කම්ය ආයුෂ නියම කරන කම්ය
- නාම කර්ම ශරීරාවය ඇති කරන කම්ය.
- අන්තරාය කම් බාධාවන් ඇති කරන කම්ය.
- ගෝත්‍ර කම්ය ජාති, ගෝත්‍ර ආදිය ඇතිකරන කම්ය

(v)
- සත්ව ඝාතණයන් වැළැකීම.
- සොරකම් කිරීමෙන් වැළකීම.
- බොරු කීමෙන් වැළකීම.
- ක්‍රෝධ නොකිරීම.
- මෛත්‍රිය වැඩීම.

03. (i)
- රාජ්‍යයේ ප්‍රභවය හේතුඵලවාදීව ඓතිහාසික පරිණාමයක් ලෙස සිදු වූ බව.
- රාජ්‍යයේ ප්‍රභවය සිදු වීමට පසුබිම් වූ සිදුවීම අග්ගඤ්ඤ සූත්‍රයට අනුව විස්තර කොට තිබිම. (''මහාජන සම්මතිති බෝ වා සෙට්ඨෝ මහා සම්මතෝ.'' මහජන සම්මතයෙන් පත්කරගත් පුද්ගලයා මහා සම්මත නමින් හැඳින්විය.
- දොස් නැගිය යුත්තාට දොස් නැගීමටත්, ගැරහිය යුත්තාට ගැරහීමටත්, නෙරපිය යුත්තා නෙරපා හැරීමටත් යනුවෙන් බලය පවරා තිබේ.
- කෙත් වලට ප්‍රධානියා යන අර්ථය ඇතිව ඔහුට ක්ෂත්‍රිය යන නාමය ව්‍යවහාර විය. (ඛෙත්තානං අධිපතිති ඛෝ වාසෙට්ඨො ඛත්තියෝ.....)
- තවද ධර්මයෙන් අනුන් සතුටු කරවන හෙයින් රජ යන නම ද ඔහුට පටබැඳුණි. (ධම්මේන පරෙ රඤ්ජේතිති ඛෝ වාසෙට්ඨෝ රාජා......)

(ii)
- කෝසල ප්‍රසේනජිත් කොසොල්
  මගධ බිම්බිසාර අජාසත්
  වත්ස උදේනි
  අවන්ති චණ්ඩපජ්ජෝත

(iii)
- වෛශ්‍යවණියට ස්වධර්ම වශයෙන් කෘෂිකර්මාන්තයේ යෙදීමට මනුස්මෘතියෙන් නියම කොට තිබීම. (වණික්පථං කුසීදංච වෛශ්‍යස්‍ය කෘෂි මේමච)
- රජවරුන්ගේ නම් සකස් කිරීමේදී ඕදක (බත්) යන වචනය යොදා තිබීම. සුද්ධෝදන අමිතෝදන මිතෝදන ශුක්ලෝදන.
- රාජවරු උත්සවශ්‍රියෙන් වප්මගුල් උත්සව පැවැත්වූ බව.
- බමුණන් පවා කෘෂිකර්මාන්තයේ යෙදී සිටීම. (කසීභාරද්වාජ බමුණා)
- ඇතැම් පුද්ගලයන්ට තිබූ කුඹුරු පිළිබඳව සඳහන්ව තිබීම. (සාලිකේදර ජාතකයෙහි කෝසිය ගෝත්තම අක්කර 17 ක කුඹුරක් තිබුණ බව සඳහන්ව තිබීම.)

(iv)
- දස සක්විතිවත් • සප්ත අපරිහානීය ධර්ම • පංචශීල ප්‍රතිපදාව • දසරාජ ධර්මය • සතර සංග්‍රහවස්තු
- සතර අගති • සතර බ්‍රහ්මවිහරණ

(v)
(1) ඡන්දය කැමැත්ත
(2) ද්වේශය තරහ
(3) භය බිය
(4) මෝහය මුලාව යනුවෙන් දක්වෙන අගතිගාමී වන කරුණු පිළිබඳව කෙටි හැඳින්වීමක් කිරීම ප්‍රමාණවත්ය.

## II කොටස

04. (i)
- ආර්ථික සමෘද්ධිය ඇතිකර ගත යුත්තේ ධාර්මික සීමාව තුළයි. සාධු යයි සම්මත රැකියා වලින් වුවද අධාර්මික සහාසික ආකාරයෙන් මුදල් ඉපයිය හැකි බැවින් බුදු සමය කිසි ලෙසකින් හෝ අයහපත් ලෙස ධනය නොඉපයීම පිණිස ධම්මිකෙන අසාහිසිකේන සුවිශේෂී පද යුගලය භාවිත කොට ඇත.
- ඒ අනුව ධාර්මික යැයි සම්මත රැකියාවන්හි වුවද සාහසික නොවී මුදල් ඉපයිය යුතුය. බෞද්ධ ඉගැන්වීම් වලින් කිසිදු ආකාරයක අධාර්මික සාහසික මුදල් ඉපයීමකට අවකාශ නැත.
- උට්ඨාන සම්ප්‍රදාවේ දක්වා ඇති පරිදි කුසීතකම හැර වීයර්යෙන් අධිෂ්ඨානයෙන් දහඩිය හෙළා කරනු ලබන සාධාරණ රැකියා බුදු සමයෙන් අනුමත ධනෝපාර්ජන මාර්ග වේ.

- ඒ අනුව කෘෂිකර්මාන්තය, ගව පාලනය, සාධාරණ වෙළඳාම, රාජ්‍ය සේවය, අන්‍ය විවිධ සාධාරණ ශිල්පක්‍රම මගින් මුදල් ඉපයීම බුදු සමය අනුමත කොට ඇත.
- සාධාරණ වෙළඳාමේ යෙදෙන තැනැත්තා නොකටයුතු වෙළඳාම් මෙන්ම, හොරට කිරීම්, හොරට මැනීම්, වංචනික ලෙස කටයුතු කිරීම් රැවටීම. (තලාකැට , සංකකැට, මානකැට ආදියෙන් සැළකිය යුතු බව දක්වා තිබීම.

(ii)
- ධනය වනාහි ගොඩ ගසාගත යුත්තක් නොව සංසරණය විය යුත්තක් බව කෝසල සංයුක්තයේ ප්‍රථම හා ද්‍විතිය අපුප්තක සූත්‍ර වල දක්වා ඇත.
- උපයාගත් ධනයෙන්,
  - (1) තමා පිනවීම අත්තානං සුඛේති පීණේති
  - (2) දෙමාපියන් පිනවීම මාතා පිතරෝ සුඛේති පීණේති
  - (3) අඹුදරුවන් පෝෂණය කිරීම පුත්තදාරං සුඛේ ති පීණේති
  - (4) දාසි දසුන් කම්කරුවන් පිනවීම දාසකම්මකරා සුඛේති පීණේති
  - (5) මිත්‍රාදීන් පිනවීම මිත්තා මච්චේ සුඛේති පීණේති
  - (6) මහණ බමුණන් විෂයෙහි දක්ෂිණාව පිහිටුව සමරණ බ්‍රාහ්මණේසු උද්දග්ගිකට දක්ඛිණං පතිට්ඨාපේති.
- භෝග සුඛය (අණන සූත්‍රය.) ● පංචබලි පිළිබඳ ඉගැන්වීම.
- සිගාලෝවාද සූත්‍රයේ දැක්වෙන යුතුකම් ඉටු කිරීම.

(iii) උට්ඨාන විරියාධි ගතේහි — උට්ඨාන වීයර්යෙන්
බහාබල පරිචිතේහි — දෑතේ දෙපයේ මහන්සියෙන්
සේදා චක්කිත්තේහි — දහදිය වගුරුවා
ධම්මේහි ධම්ම ලද්දේහි — ධාර්මිකව ධනය ඉපයිය යුතු බව,

- කෘෂිකර්මාන්තය, ගව පාලනය, වෙළඳාම, රාජ්‍ය සේවය, වැනි දැහැමි රැකියා සඳහා ශ්‍රමය වැය කළයුතුය.
- උට්ඨාන සම්පදා — උත්සාහයෙන් ධනය ඉපයිය යුතු බව. (ව්‍යග්ගපජ්ජ සූත්‍රය)
- කිසිදු කරුණක් නිසා අධාර්මික සමෘද්ධිමත් භාවය බුදු සමය අගය නොකරන බව.

(iv)
(1) උට්ඨාන සම්පදා — උත්සාහයෙන් ධනය ඉපයීම.
(2) ආරක්ඛ සම්පදා — උපයාගත් ධනය ආරක්ෂා කර ගැනීම.
(3) කල්‍යාණමිත්තතා — පාපමිත්‍ර ඇසුරින් වැළකී කල්‍යාණ මිතුරන් ඇසුරු කළ යුතුය.
(4) සමජිවකතා — අයවැය සමතුලිතව පවත්වා ගනිමින් ජිවත් වීම.

- ව්‍යග්ගපජ්ජ සූත්‍රයට අනුව රැකීරක්ෂා සඳහා ශ්‍රමය වැය කිරීමේ දී අධික සීතලය. අධික උෂ්ණය, අධික බඩගින්න ආදී වශයෙන් නොසලකා කටයුතු කළ යුතුය.

05. (i) සිගාල ගෘහපතියා සිය පියාගේ උපදේශය හා ඉල්ලීම පරිදි උදෑසන දියේ ගිලී තෙත වස්ත්‍රයෙන් යුතුව නැගෙනහිර, බටහිර, උතුර, දකුණ, උඩ යට යන දිසා සයට නමස්කාර කිරීම.

- බුදුන්වහන්සේ එම දිසාවන්ට ගුණාත්මක අර්ථයක් සපයමින් පුද්ගලයකුට අවශ්‍යයෙන්ම සම්බන්ධවන සමාජ සංස්ථා යුගල හයක් දිසා හයෙන් නියෝජනය වන ලෙස අර්ථ ගන්වා තිබීම.
- මාතා පිතා දිසා පුබ්බා — ආචර්යා දක්ඛිණා දිසා
- පුත්තදාරා දිසා පච්ඡා — චිත්තා මච්චාච උත්තරා

දාසකම්ම කරා සෙට්ඨා — උද්ධං සමණා බ්‍රාහ්මණා
ඒතාදිසා නමස්සෙය්‍ය — අලමත්තෝ කුලෙගිහි.

- මව්පියන් හා දරුවන් — පූර්වදිසාව
- ආචාර්යවරුන් හා ශිෂ්‍යයන් — දකුණු දිසාව
- ස්වාමිපුරුෂයන් හා අඹුදරුවන් — බටහිර දිසාව
- මිත්‍ර කුලපුත්‍රයන් — උතුරු දිසාව
- ස්වාමිපක්ෂය දැසිදස් කම්කරුවන් — යට දිසාව
- මහණ බමුණන් හා දායක පක්ෂය — උඩ දිසාව

(ii)
- පැවිදි සමාජය වනාහි ගිහි සමාජයේ සිවුපස දානය මත යැපෙන සංස්ථාවක් බැවින් ගිහි සමාජයෙන් තොරව ශාසනික පැවැත්මක් ගැන කල්පනා කළ නොහැක.

- ශ්‍රාවක ශ්‍රාවිකාවන් ලෙස භික්ෂු භික්ෂුණී සමාජය මෙන්ම උපාසක උපාසිකා සමාජය ද වශයෙන් සිව්වනක් පිරිසක් බුදු සමය පිළිගෙන ඇත්තේ එබැවිනි.
- සිගාලෝවාද සූත්‍රයේ මනා ගිහි පැවිදි සබඳතාවක් පවත්වාගත යුතු ආකාරය කරුණු 11 ක් යටතේ දක්වා ඇත. එනම් ගිහියා කරුණු පහකින් භික්ෂුවට ද භික්ෂුව කරුණු යහකින් ගිහියාට ද යුතුකම් ඉටු කළ යුතුය. එම යුතුකම් නම් කිරීම අවශ්‍යයි.

(iii)
- චේතනාව හා විපාක වශයෙන් දෙකොටසකට බෙදේ.
- යහපත් චේතනාවෙන් තුන් දොරින් සිදු කරන ක්‍රියා යහපත් ක්‍රියා හෙවත් කුසල ක්‍රියාය.
- අයහපත් චේතනාවෙන් සිදුකරන ක්‍රියා පාපී ක්‍රියා අකුසල ක්‍රියා නම් වේ.
- යම් ක්‍රියාවකින් ලැබෙන විපාක හොඳ නම් ඒවා යහපත්ය.
- යම් ක්‍රියාවකින් ලැබෙන විපාකය අයහපත් නම් ඒවා නරක ක්‍රියාය.
- අංගුත්තර නිකාය කාලාම සූත්‍රය මජ්ඣිම නිකාය අම්බලට්ඨික රාහුලෝවාද සූත්‍රය, අංගුත්තර නිකාය තිකනිපාතයේ ආධිපත්‍යය ධර්‍ම.
- ධම්මපදයේ නතං කම්මං කතං සාධු යන ගාථාව.

  දීඝ නිකායේ මහා පරිනිබ්බාණ සූත්‍රයේ දැක්වෙන සතර මහාපදේස ආදියේ හොඳ නරක ක්‍රියාවන් පිළිබඳ නිර්ණායක දක්වා තිබීම.

(iv)
- බොහෝ වූත් විශාල වූත් බලාපොරොත්තු ප්‍රාර්ථනා තබා නොගැනීම අල්පේච්ඡතාව, එහි විරුද්ධ පදය මහේච්ඡතාවයි. (බොහෝ ආශා ඇති බවයි.)
- කාම භෝගී භෞතික සැප සම්පත් විශාල වශයෙන් අපේක්ෂා නොකිරීම අල්පේච්ඡතාවයි. අල්පේච්ඡතාවනිර්ලෝභය ලෙසද ධර්මයෙහි දක්වා තිබීම.
- අලපේච්ඡතා ගුණයෙන් යුතු පුද්ගලයා අසීමිත ආශාවන් පසු පස හඹාගොස් තමාටත් සාජයටත් අහිත කර දේ සිදු නොකරයි.
- ඔහු තුළ තෘප්තිමත් භාවයක් ඇති හෙයින් අධාර්මික රැකී රක්ෂා වල යෙදී වැරදි ලෙස ධනය නො උපයයි.
- අසහනය අල්පේච්ඡ පුද්ගලයාට නොමැති බැවින් අසහනය හේතුවෙන් සමාජයේ සිදුවන අපරාධ ඔහුගෙන් සිදු නොවේ.
- අල්පේච්ඡතා ගුණයෙන් යුතු පුද්ගලයා මානසික නිරෝගීතාවෙන් යුතු බැවින් එය කායික නිරෝගී කමටද හේතු වේ.

06. (i)
- දෙව් බඹුන් මිනිසුන් හා සතුන් දමනය කිරීමේ සුවිශේෂී ගුණය පුරුෂ දම්ම සාරථී ගුණය නම් වේ.
- ආලවක යක්ෂ දමනය, අංගුලිමාල දමනය, සච්චක දමනය, නාලාගිරි දමනය යනාදී නිදසුන් ඇසුරින් පැහැදිලි කළ යුතුය.

(ii)
- පියුම දියෙහි ඉපිද, දියෙහි වැඩී, දියෙන් උඩට පැමිණ දිය හා අසම්බන්ධව පවතී. එසේම බුදුන්වහන්සේ මිනිස් ලොව ඉපිද කෙලෙස් සහිත ලෝකයා හා අසම්බන්ධව සිටීම, පද්මාකාර ජීවිතය ලෙස සැළකේ.
- පුණ්ඩරීකං යථා වග්ගු තෝසේන නූප උප්පති
- නූපලිත්තේම්හි ලෝකේන තස්මා බුද්ධෝස්මි බ්‍රාහ්මණ
- සාමාන්‍ය මිනිසුන්ට වෙනස් වූ චරිත ලක්ෂණ ප්‍රදර්ශණය කිරීම.
- බුදුරජාණන් වහන්සේ අටලෝ දහමින් කම්පා නොවූ අවස්ථා උදාහරණ ලෙස දැක්විය හැකිය.
- කෙලෙස් වලින් ආතුර වූවන් අතර අනාතුරව විසූ බුදුරදුන් වෛර කරන්නන් අතර අවෛරීව විසූහ.

(iii)
- බුදුරදුන් අන්‍යාගමික ආරාම වලට වැඩමකර එම ආගමිකයන් සමඟ සාකච්ඡා කිරීම. උදා: පොට්ඨපාද පිරිවැජියා, සන්දක පිරිවැජියා, සකුළුදායී පිරිවැජියා.
- අන්‍යාගමිකයන්, වාද විවාද වලට පැමිණි අවස්ථාවන්හි මෛත්‍රියෙන් යුතුව කරුණු පෙන්වා දීම.
- බහු ආගමික සමාජයක සුහදව හා විචාරශීලීව ජීවත්වීම පිළිබඳව උදාහරණ ලෙස. කේසපුත්ත කාලාමවරුන්, උපාලි ගෘහපතියා, අභයරාජ කුමාරයා ආදීන් පෙන්විය හැකිය.
- අන්‍යාගමික පිරිස් මගින් කරුණු පෙන්වා දීම.

(iv) • බුදුන්වහන්සේ ගේ චරිතය පුරාම උන්වහන්සේ ගේ සුවිශේෂී ගුණාංග විවිධ අවස්ථාවන් හිදී විවිධ පුද්ගලයන් අතින් අගය කිරීමට ලක් වී ඇත.
• සෝණ දණ්ඩ, පොට්ඨපාද, සකුළුදායී, පිලෝතික ආදී පිරිවැජියන්, බ්‍රාහ්මණයන් බුදුරදුන් පිළිබඳව ඇගයීම් කිරීම ආදී විස්තර
• ශ්‍රාවක ශ්‍රාවිකාවන් බුදුරදුන් ගේ ගුණ වර්ණනා කිරීම.
• කොසොල් රජු, උපාලි ගෘහපති, අභයරාජ කුමාරයා ආදීන් බුදුරදුන් පිළිබඳ ඇගයීම් කළ අවස්ථා පෙන්වා දෙන්න.

07. (i) • බෞද්ධ සබ්බජ්ජාව ආරම්භ වූයේ ඒහි භික්ඛු පබ්බජ්ජාවෙනි. • සරණාගමන පබ්බජ්ජාව දෙවනුව හඳුන්වා දී ඇත. • බුදුරදුන් සතුව පැවති පැවිදි කිරීමේ බලය භික්‍ෂූන්ට ද පැවරීම. • අන්‍ය පැවිද්දන් තුළ නොපෙනෙන ප්‍රසාද ජනක බොහෝ ශ්‍රමණ සාරුෂ්‍ය චරියා සේඛියා මගින් එක් කිරීම. • මුලදී එකට ලබාදුන් පැවිදි උපසම්පදාව පසුව දෙඅංශයකින් විකාශය වීම. • ආචාර්ය අන්තේවාසික, උපාධ්‍යාය, සද්ධි විහාරික වශයෙන් ගුරු ශිෂ්‍ය සම්බන්ධතාව වර්ධනය වීම. •පැවිද්දට නුසුදුසු අභව්‍ය පුද්ගලයන් නිර්දේශ කොට සුදුසුකම් ක්‍රමවත්ව නිර්දේශ කිරීම. •ඕවාද පාති මොක්ඛයෙන් පටන්ගෙන ආඥා දේශනා දක්වා පැවිදි විනය විකාශය වීම.

(ii) • ලෞකිකත්වයට වඩා අධ්‍යාත්මික අංශයට නැඹුරු වීම. • චාම් සැහැල්ලු ගති පැවතුම් වලින් යුක්ත වීම. • සංඝාධි කරණයෙහි ක්‍රියාත්මක ප්‍රජාතාන්ත්‍රික ලක්‍ෂණ. • සාංඝික ක්‍රමය හෙවත් පොදු අයිතිය තහවුරු කිරීම. • සංඝ සාමග්‍රිය සුරැකීම. • ශාසනික පියපුතු සෙනෙහසින් ක්‍රියා කිරීම.

(iii) • ප්‍රසන්න ආකල්ප ඇතිවීම. • සුභරතාව අල්පේච්ඡතාව • සිවු පසයෙහි හා දායක කුලයන්හි නො ඇලීම. • සිවු පසය ලද පමණින් තෘප්තිමත් වීම. (යථාලාභ සන්තෝසය) • පුද්ගල හා පාරිසරික පවිත්‍රතාව ගැන සැලකිලිමත් වීම. • ආදර්ශමත් ලෙස ඉඳුරන් සංවර කිරීම. • සේඛියා වැනි විනය ශික්‍ෂා ගෞරවයෙන් පිළිපැදීම. • බහු කෘත්‍ය භාවයෙන් ඈත්ව භාවනායෝගී වීම. • අතීතය ගැන ශෝක නොකර, අනාගතය ගැන ප්‍රාර්ථනා නොකර වර්තමානයේ සතුටින් ජීවත් වීම.

(iv) • භික්‍ෂූන් විසින් මහජන උද්ඝෝෂණය ගැන දැන්වීමෙන් පසුව වස් විසීම අනුමත කිරීම. • වැසි සමයෙහි ඇති දුෂ්කරත්වය සැලකිල්ලට ගැනීම. • සුදුසු ස්ථානවල පමණක් වස් විසීම සඳහා තෝරා ගැනීම. • වැසිසළු අනුමත කිරීම. • පෙරවස් හා පසුවස් සමාදානය අනුමත කිරීම. •උපෝසථ හා විචාරණ විනය කම් අනුමත කිරීම. • කඨින චීවරය අනුමත කිරීම.

08. (i) • ධර්මධර විනයධර මතවාද • දේවදත්ත හිමියන්ගේ පංචවර ආයාචනය හා භික්‍ෂු නායකත්වය ඉල්ලීම. • විනය ශික්‍ෂා පැනවීමේ දී ඇති වූ විරෝධතා • දාර්ශනික මතවාද • සාති භික්‍ෂුවගේ භවගාමී විඤ්ඤාණ වාදය. • අරිට්ඨ භික්‍ෂුව භික්‍ෂූන්ට කම්සුව අනුමත කරණ ලෙස ඉල්ලීම. • ඡන්න, ඡබ්බග්ගිය, උදායි වැනි භික්‍ෂූන්ගේ නොහික්මුණු ක්‍රියා.

(ii) • විසිරී පැවති ධර්මය එක්රැස් කොට කොටස් වලට බෙදා පොදුවේ සංඝ සම්මතය ලබා ගැනීමට හැකි වීම. • සංගායනාව අවසානයේ අනාගතය සඳහා ධම් විනය ආරක්‍ෂා කර ගැනීමට ඒ ඒ කොටස් භාණක පරම්පරා වලට බාරදීම. • විනය ශාසනයේ ආයුෂ ලෙස පිළිගැනීම. • කුඩා අනුකුඩා ශික්‍ෂා පද වෙනස් කිරීමට බුදු රදුන් දී තිබූ අවසරය භාවිත නොකරන්නට තීරණය කිරීම. • ආනන්ද හිමියන් වෙත එල්ලවූ චෝදනා වලින් උන්වහන්සේ නිදහස් කිරීම. • ධම් විනය එක්රැස් කිරීම.

(iii) • බිම්බිසාර රජු ප්‍රථම ආරාම පූජාව වූ රජගහනුවර වේළුවනාරාමය කරවා පූජා කිරීම. (බුදුන්වහන්සේ වස්කාල හයක් එහි වැඩ විසීම.) • කොසොල් රජු සෑම අවස්ථාවකම බුදු රදුන් හමු වී සාකච්ඡා කළ බව කෝසල සංයුතියෙන් පැහැදිලි වීම. කොසොල් රජු විසින් රාජිකාරාමය කරවීම. • ශාක්‍ය වංශිකයන් නිග්‍රෝධාරාමය කරවා පූජා කිරීම. • අජාසත් රජු ප්‍රථම සංගීතියට අනුග්‍රහය දැක්වීම. • අනේ පිඬු සිටුතුමා ජේතවනාරාමය කරවා පූජා කිරීම. • විශාඛා මහෝපාසිකාව පූර්වාරාමය කරවා පූජා කිරීම හා දිනපතා භික්‍ෂූන්ට සිවු පසයෙන් උපස්ථාන කිරීම.

(iv) • ප්‍රථම රහත් සැටනම ධම් ප්‍රචාරයේ වැඩමවීමෙන් උපතිස්ස කෝලිත වැනි පිරිස් සසුනට එක් වීම.
• මහාකච්චාන හිමි අවන්තියේ ධම් ප්‍රචාරය කිරීම මගින් විවිධ පුද්ගලයින් බුදු සසුනෙහි පැවිදි වීමට කැමැත්ත පළ කිරීම.
• පිණ්ඩෝල භාරද්වාජ හිමි උදේනි රාජු පැහැදවීම.
• රෞද්‍ර මිනිසුන් සිටින සුනාපරන්ත දේශයට වැඩමකළ පුණ්ණ තෙරුන් ධම් ප්‍රචාරය කිරීම.
• භික්‍ෂූන් වහන්සේලා භාරතයේ විවිධ ප්‍රදේශවල ධම් ප්‍රචාරයේ නිරත වීම නිසා ඒ ඒ ජන පදයන්හි දිසාවන්හි දී පැවිදි උපසම්පදාව ලබා දීමට තීරණය කිරීම.
• මහාප්‍රජාපතී තෙරණියන් එතුමිය සමග පැවිදිවූ ශාක්‍යවංශික කුමාරිකාවන් 500 නමක් ශාසනයේ ව්‍යාප්තිය සඳහා දායක වීම.
• මහාප්‍රජාපතී ගෝතමී, ඛේමා, උත්පලවණ්ණා, පටාචාරා ආදී භික්‍ෂුණීන්ගේ ක්‍රියාකලාපය.

**I** පත්‍රය 50 x 2 = 100 **II** පත්‍රය 40 + 60 = 100 = 200 / 2 = 100